Schweizerische Eidgenossenschaft
Confédération suisse
Confederazione Svizzera
Confederaziun svizra

Federal Department of Justice and Police FDJP

**Federal Office of Justice FOJ**
Private Law Division
Federal Civil Status Office FCSO

# ස්විට්සර්ලන්තයේ විවාහ කටයුතු පිළිබඳ තොරතුරු පත්‍රිකාව: අයිතිවාසිකම් සහ බැඳීම්

ස්විට්සර්ලන්තයේ විවාහක අයිතිවාසිකම් සහ බැඳීම් පළිබඳ කෙටි විස්තරයක් ගැන පැහැදිලිකිරීමක් පහත දැක්වේ. එහෙත් මේ පිළිබඳ කිසිදු නීතිමය බලකිරීමක් නැත. පවතින නීතිමය නියමයන් පොදුනොවූ අධිකාරියක්වේ.

මෙම තොරතුරු පත්‍රිකාව බෙදාහරිනු ලබන ස්විට්සර්ලන්තයේ සිවිල් ලියාපදිංචි කාර්යාල, විදේශ රටවල පිහිටි ස්විට්සර්ලන්තයේ නියෝජිතයින් සහ විවාහක සහ අවිවාහක තත්වය පිළිබඳ සන්ධිය කාර්යාලය මේ ගැන උපකාරක උපදේශනයක් ලබාදීමට රාජකාරිමය වගකීමක් ද දරන්නේ නැත. එබැවින් මෙම තොරතුරු පත්‍රිකාව පිළිබඳව උපදෙස් අවශ්‍යවන්නේ නම් පෞද්ගලිකව නීතිමය උපදෙස් (තොරතුරු මධ්‍යස්ථාන, නීතිඥ, නොතාරිස් යන අයගේ) සහය ලබාගන්න.

## ස්විට්සර්ලන්තයේ විවාහක අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ කෙටි විස්තර

ස්විට්සර්ලන්තයේ නීතිය අනුව ඉතා වැදගත් අයිතිවාසිකම් සහ බැඳීම් පහත දැක්වේ. මේවා ලැයිස්තුගතකර තිබෙන්නේ යම් පිළවෙලකට හෝ සවිස්ත්‍රාකාරයකට ද නොවේ.

- **වයස අවුරුදු 18ක් හෝ ඊට වැඩි පිරිමියෙකු හෝ ගැහිණියක් අතර පමණක් විවාහය සිදු කළ හැකිය:** ස්විට්සර්ලන්තයේ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් විවාහවිය හැකි අවම වයස වයස අවුරුදු 18ක් වේ. පාර්ශවකරුවන් දෙදෙනාම වයස අවුරුදු 18 සම්පූර්ණ කරත්ම විවාහවීමට සුදුස් සෝ වෙති.

- **සෑම කෙනෙකුටම ඔහුගේ හෝ ඇයගේ කාලත්‍රයා නිදහසේ තෝරාගත හැකිය; කිසි කෙනෙකුට විවාහවීමට බලකළ නොහැකිය:** විවාහය දෙදෙනාගේම සිය කැමැත්ත මත තීරණය වෙයි. කිසිකෙනෙකුට ඔහුගේ හෝ ඇයගේ කැමැත්තකින් තොරව විවාහවීමට බලකළ නොහැකිය.

- **විශ්වසනීයත්වයට සහ සහයෝගයට කැපවීම:** විවාහ බන්ධනයේ යහපත පිණිස කාලත්‍රයන් දෙදෙනාම ක්‍රියා කළයුතුය. දෙදෙනාගේ පෞර්ෂවයට එකිනෙකා ගරුකළ යුතුය. කාලත්‍රයන් දෙදෙනාම එකිනෙකාගේ අභිමතයට එරෙහි නොවිය යුතුය.

- **සෑම කටයුත්තකදීම පුරුෂයාට සහ ස්ත්‍රියට සම අයිතිවාසිකම් හිමිය:** සෑම කරුණකදීම සැමියා සතු සියලුම අයිතාවාසිකම් බිරිඳටද හිමිය. ඔහුගේ හඬට මෙන්ම ඇගේ හඬටද සමාන හිමිකම් ඇත.

- **විවාහයේ සෑම ඉලක්කයක් ලඟාකර ගැනීමට පොදු එකඟතාවයක් (නිවසින් පිටත කෙරෙන වැඩ, ගෘහයේ රාජකාරි):** කාලත්‍රයන් දෙදෙනාම සමාන නිසා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගනිමින් නිශ්චිත ඉලක්ක බෙදාගැනීමක් පැවතිය නොහැකිය. ඉලක්ක බෙදා ගැනීම ගැන කාලත්‍රයන් දෙදෙනාම සාකච්ඡාකර එකඟතාවයකට පැමිණිය යුතුය.

- **පවුලේ යැපීමට පොදු මූල්‍ය දායකත්වයක් :** මෙම කරුණ පිළිබඳව ද ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගනිමින් නිශ්චිත ඉලක්ක බෙදාගැනීමක් පැවතිය නොහැකිය. කාලත්‍රයන් ඒකා බද්ධව පවුලේ යැපීම සඳහා මූල්‍යමය දායකත්වය ලබාදිය යුතුවේ. කවුරු කෙසේ දායකත්වය ලබා දියයුතු ද යන්න ගැන ඔවුන් ඒකාබද්ධව එකඟවිය යුතුය.

- **ළමයින් පිළිබඳව ඒකාබද්ධ රැකවරණයඃ** තම දරුවන්ගේ රැකවරණය, ඔවුන්ට අධ්‍යාපනයක් ලබාදීම, අනතුරුවලින් සහ තර්ජනවලින් ඔවුන් ආරක්ෂා කිරීම යනාදිය පිළිබඳව කාලත්‍රයන් දෙදෙනා බැඳී සිටිති.

- **විවාහ ජීවිතයේදී ප්‍රචණ්ඩත්වයක් සිදුවිය නොහැකියඃ** ඕනෑම කාලත්‍රයෙක් අනෙකාට පහරදීමක් හෝ බැණ වැදීමක් සිදුකළහොත් ඔහුට හෝ ඇයට විරුද්ධව නඩු පවරනු ලැබේ. සැමියා තම බිරිඳට එරෙහිව ශාරීරික දඬුවම් නොකළ යුතුය.

- **විවාහක බැඳීම් උල්ලංඝනය කරන ඕනෑම කාලත්‍රයෙකුට එරෙහිව අනෙකාට අධිකරණයේ ආරක්ෂාව පැතිය හැකිය :** යම් කාලත්‍රයෙක් තම පවුලේ සාමාජිකයින්ට හිමි බැඳීම් සපුරන්නේ නැත්නම් විවාහක බන්ධනයට වැදගත් කරුණක් ගැන කාලත්‍රයන්ට එකඟතාවයකට පැමිණිය නොහැකි නම් අධිකරණයට මැදිහත්වන ලෙස ඔවුනට එක්ව හෝ වෙන වෙනම ඉල්ලා සිටිය හැකිය.

- **සෑම කාලත්‍රයෙකුටම දික්කසාදවීමේ අයිතියක් ඇතඃ** වලංගු විවාහයක් දික්කසාද වීම තුළින් අහෝසි කළ හැකිය. කාලත්‍රයන් දෙදෙනාටම දික්කාසාද වීමට අවශ්‍යවේ නම් ඒකාබද්ධ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත්කළ හැකිය. එක්කාලත්‍රයෙකුට දික්කසාදවීමට අවශ්‍යනම් ඔහුට හෝ ඇයට තනිව පෙත්සමක් අධිකරණයට යොමු කළ හැකිය.